[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

# සාමාන්‍ය පොදු පරීක්ෂණය
# பொதுச் சாதாரணப் பரீட்சை
# Common General Test

12 S

පැය දෙකයි මිනිත්තු තිහයි.
இரண்டு மணித்தியாலமும் முப்பது நிமிடமும்
*Two hours and thirty minutes*

- **ඔබගේ පිළිතුරු පත්‍රය පරිගණකය මගින් ලකුණු කෙරෙන බැවින් පහත දැක්වෙන උපදෙස් හරියේ පිළිපදින්න.**
  - * OMR පිළිතුරු පත්‍රයේ ශීර්ෂ කොටස (header) නිවැරදිව හා සැලකිලිමත්ව සම්පූර්ණ කරන්න. අදාළ වෘත්ත නිවැරදි ව අඳුරු කිරීමෙන් ඔබේ **විභාග අංකය, විෂය අංකය** සහ **මාධ්‍යය** දක්වන්න.
  - * සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - * **1** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (1), (2), (3), (4), (5) වරණ අතරෙන් **නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන** වරණය තෝරා, පහත දී ඇති උපදෙස් අනුගමනය කරමින් ඔබේ ප්‍රතිචාරය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.
    1. ඔබ තෝරාගත් වරණයෙහි අංකය දක්වෙන වෘත්තය, පහත නිදසුනෙහි දක්වෙන ආකාරයට සම්පූර්ණයෙන් අඳුරු කරන්න.

       **නිදසුන:** තෝරාගත් වරණයෙහි අංකය 4 නම්, පහත දක්වෙන ආකාරයට අඳුරු කළ යුතුය.

       ① ② ③ ● ⑤
    2. එක් පිළිතුරක් සඳහා එක් ප්‍රතිචාරයක් පමණක් සලකුණු කළ යුතුය. ප්‍රතිචාර එකකට වඩා සලකුණු කළහොත් ඔබේ පිළිතුර ප්‍රතික්ෂේප වේ.
    3. ඔබ නිවැරදි ප්‍රතිචාරය ලෙස තෝරා ගන්නා අංකය අයත් වෘත්තය සම්පූර්ණයෙන් ම අඳුරු කළ යුතුය. මේ සඳහා කළු හෝ නිල් තීන්ත පෑනක් පාවිච්චි කරන්න. අදාළ වෘත්තයට පිටතින් ඇති ඕනෑ ම සලකුණක්, පරිගණකය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
  - * පිළිතුරු පත්‍රය මත කටු සටහන් නොකළ යුතුය. ඒ සඳහා වෙනම කඩදාසියක් ලබාගන්න.

---

1. නවතම සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය
   (1) මිලියන 19 ට වඩා අඩු ය.
   (2) මිලියන 19 ක් පමණ වේ.
   (3) මිලියන 19 ත් 20 ත් අතර වේ.
   (4) මිලියන 20 ත් 21 ත් අතර වේ.
   (5) මිලියන 21 ට වඩා වැඩි ය.

2. ඔලිම්පික් ක්‍රීඩා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය **අසත්‍ය** වේ ද?
   (1) ඒවා පුරාණ ග්‍රීසියේ ඇතන්ස්හි ආරම්භ විය.
   (2) 2012 දී උසේන් බෝල්ට් ඔලිම්පික් වාර්තාවක් පිහිටුවමින් 100 m තරගය ජය ගත්තේ ය.
   (3) ඒවා සෑම වර්ෂ හතරකටම වරක් පැවැත්වේ.
   (4) ඔලිම්පික් ක්‍රීඩාවලදී කිසිදු ශ්‍රී ලාංකිකයකු රන් පදක්කමක් දිනා නැත.
   (5) ඔලිම්පික් ක්‍රීඩාවලදී කිසිදු ක්‍රීඩකයකු මත්විරෝධී පරීක්ෂණය (රසායනික වංචනික පරීක්ෂණය) අසමත් වී නැත.

3. ලෝකයේ වැඩිම මරණ සංඛ්‍යාවකට හේතුවන්නේ පහත දක්වෙන කවරක් ද?
   (1) දුම්කොළ (2) මද්‍යසාර (3) හෙරොයින් (4) මෝටර්රථ අනතුරු (5) මිනීමැරුම්

4. මද්‍යසාර සමඟ සම්බන්ධ **නොවන්නේ** පහත දක්වෙන කවරක් ද?
   (1) අක්මා රෝග
   (2) හදිසි අනතුරු
   (3) මොළයේ උත්තේජනය
   (4) හෘදයාබාධ
   (5) ප්‍රචණ්ඩත්වය

5. "ඔබේ දුම්වැටිය මා මරාදමයි" යනු
   (1) වෛද්‍ය මතයකි.
   (2) විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් නිගමනයකි.
   (3) චිත්‍රපටයක නමකි.
   (4) දුම් නොබොන්නන්ගේ විශ්වාසයකි.
   (5) පාසල් ශිෂ්‍යාවන් බියගැන්වීම සඳහා වෛද්‍යවරුන් විසින් නිර්මාණිත කියමනකි.

6. ඩෙංගු පතුරුවන මදුරුවා *Aedes aegypti* වේ. මෙම මදුරුවා සඳහා සුදුසු අභිජනන ස්ථානයක් **නොවන්නේ** පහත දක්වෙන කවරක් ද?
   (1) ගලන ගංගා
   (2) ඉවත දමන ලද හිස් යෝගට් කෝප්ප
   (3) වත්තේ ඇති හිස් පොල්කටු
   (4) අතහැර දමා ඇති පැරණි ටයර්
   (5) වහළ පීලි

7. "දේව අංශුවක් (God particle)" පිළිබඳව මෑතකදී පුවත් පළවිය. දේව අංශුව අයත්වන්නේ කුමන විෂයයකට ද?
   (1) භෞතික විද්‍යාව (2) ආගම ධර්මය (3) සමාජ විද්‍යාව (4) ජීව විද්‍යාව (5) ගුප්ත විද්‍යාව

[ දෙවැනි පිටුව බලන්න

8. පසුගිය දශක දෙක තුළ ප්‍රධාන අමාත්‍යවරයකු **නොසිටි**, ශ්‍රී ලංකාවේ එකම පළාත වනුයේ
   (1) දකුණු පළාතයි. (2) සබරගමුව පළාතයි.
   (3) උතුරු පළාතයි. (4) නැගෙනහිර පළාතයි.
   (5) මධ්‍යම පළාතයි.

9. පසුගිය වර්ෂ කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය
   (1) 2% ට වඩා අඩු ය. (2) 3% පමණ වේ.
   (3) හරියටම 4% කි. (4) 4% සහ 5% අතර වේ.
   (5) 5% ට වඩා වැඩි ය.

10. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර සාමාජිකයකු **නොවන්නේ** පහත දක්වෙන කවර රට ද?
   (1) චීනය (2) එක්සත් රාජධානිය
   (3) ඇමෙරිකා එක්සත් ජනපදය (4) ඉන්දියාව
   (5) රුසියාව

11. 2012 අප්‍රියෙල් මාසයේ මියන්මාරයේ පැවති අතුරු මැතිවරණවලදී, අවුන් සාන් සු කී පාර්ලිමේන්තුවට තෝරාපත්කරනු ලැබීය. පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් කුමක් **අසත්‍ය** වේ ද?
   (1) ඇය, 1947 දී බ්‍රිතාන්‍යයෙන් තම රටට නිදහස ලබාගැනීමට නායකත්වය දුන් දේශපාලනඥයාගේ දියණියයි.
   (2) ඇය සාමය සඳහා නොබෙල් ත්‍යාගයක් ලැබුවා ය.
   (3) ඇගේ පක්ෂයට (NLD) දැන් මියන්මාර් පාර්ලිමේන්තුවේ බහුතර බලය ලැබී ඇත.
   (4) ඇය බ්‍රිතාන්‍ය ජාතිකයකු හා විවාහ වී සිටියා ය.
   (5) ඇය වසර ගණනාවක් පුරා නිවාස (සිර) අඩස්සියේ පසුවූවා ය.

12. ඉන්දීය ජනරජයේ වර්තමාන ජනාධිපතිවරයා
   (1) ප්‍රතිභා පාටිල් ය. (2) ප්‍රනාබ් මුඛර්ජි ය.
   (3) පූර්ණෝ සංග්මා ය. (4) ආචාර්ය අමාත්‍යා සෙන් ය.
   (5) ආචාර්ය අබ්දුල් කලාම් ය.

13. සිරියාව පසුගිය මාසවල අන්තර්ජාතික සාමයට පවා තර්ජනයක් වූ දේශපාලනික හා සිවිල් නොසන්සුන් තත්ත්වයක පැවතිණි. සිරියාව පිළිබඳව පහත කුමන ප්‍රකාශය **අසත්‍ය** වේ ද?
   (1) එය ආසියාතික රටකි.
   (2) එහි අගනුවර ටෙහෙරාන් වේ.
   (3) එහි ජනගහණයෙන් බහුතරය අරාබි භාෂාව කථාකරන මුස්ලිම්වරු වෙති.
   (4) එය තුර්කිය සමඟ දිගු දේශ සීමාවක් හවුලේ භාවිත කරයි.
   (5) එහි එක් අසල්වැසියකු ලෙබනනය වේ.

14. මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමට එරෙහි පෙත්සමක් ඉදිරිපත් කළ යුත්තේ
   (1) මහේස්ත්‍රාත් උසාවියකට ය. (2) දිස්ත්‍රික් උසාවියකට ය.
   (3) අභියාචනාධිකරණයකට ය. (4) ශ්‍රේෂ්ඨාධිකරණයට ය.
   (5) ඔම්බුඩ්ස්මන්වරයාට ය.

15. පහත සඳහන් කවර ක්ෂේත්‍රයක් සඳහා වසරක් පාසා නොබෙල් ත්‍යාගය ප්‍රදානය කරනු ලැබේ ද?
   (1) සංගීතය (2) සාහිත්‍යය (3) සිතුවම් (4) නැටුම් (5) චිත්‍රපට

16. පියෙක් තම පුතුන් තිදෙනා සඳහා එකක් සුදුපාට ද එකක් නිල්පාට ද අනෙක කහපාට ද වන සේ කමිස රෙදි තුනක් මිලට ගත්තේ ය. එක් පුතෙක් සුදුපාටට අකමැති ය. තවත් පුතෙක් නිල්පාටට අකමැතිය. අනෙක් පුතා කහපාටට අකමැතිය. පැම පුතකුටම තමා අකමැති පාටින් කමිස රෙද්දක් නොලැබෙන සේ කමිස රෙදි තුන පුතුන් තිදෙනා අතර බෙදා දිය හැකි එකිනෙකට වෙනස් ආකාර කීයක් තිබේ ද?
   (1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

17. අරය $2r$ වන සිහින් වෘත්තාකාර $B$ නම් ලෝහ තැටියකින් අරය $r$ වන වෘත්තාකාර $A$ නම් ලෝහ තැටියක් කපා ඉවත්කර ඇත. $A$ තැටියේ වර්ගඵලයත් $B$ තැටියේ ඉතිරි කොටසෙහි වර්ගඵලයත් අතර අනුපාතය
   (1) 3:1 (2) 2:1 (3) 1:1 (4) 1:2 (5) 1:3

18. $A$ නම් සෘජුකෝණාස්‍ර ඉඩමක වර්ගඵලය, $B$ නම් සෘජුකෝණාස්‍ර ඉඩමක වර්ගඵලය මෙන් දෙගුණයක් නම්, $A$ ඉඩමේ පරිමිතිය,
   (1) $B$ ඉඩමේ පරිමිතිය මෙන් දෙගුණයක් වේ. (2) $B$ ඉඩමේ පරිමිතිය මෙන් සිවුගුණයක් වේ.
   (3) $B$ ඉඩමේ පරිමිතිය මෙන් අටගුණයක් වේ. (4) $B$ ඉඩමේ පරිමිතියට වඩා වැඩි වේ.
   (5) $B$ ඉඩමේ පරිමිතියට සමාන විය හැකිය.

19. කිසියම් පුද්ගලයකුගේ උපන්දිනය 2012 ඔක්තෝබර් මස අවසාන සඳුදා දිනය වේ නම්, ඔහුගේ **ඊළඟ** උපන්දිනය යෙදෙනුයේ සතියේ කුමන දවසක ද?
   (1) ඉරිදා (2) සඳුදා (3) අඟහරුවාදා (4) බදාදා (5) සිකුරාදා

[ තුන්වැනි පිටුව බලන්න.

20. දුම්රියක් *A* නම් දුම්රියපළෙන් පිටත්ව *B* නම් දුම්රියපළට 50 km h$^{-1}$ නියත වේගයෙන් ගමන් කළේය. තවත් දුම්රියක් එම මොහොතේම *B* දුම්රියපළෙන් පිටත්ව *A* දුම්රියපළට 65 km h$^{-1}$ නියත වේගයෙන් ගමන් කළේය. *A* දුම්රියපළෙහි සිට 10 km දුරින් පිහිටි ස්ථානයකදී දුම්රිය දෙක හමුවේ නම්, දුම්රියපළ දෙක අතර දුර කොපමණ ද?
(1) 20 km (2) 23 km (3) 25 km (4) 27 km (5) 30 km

21. මිනිසෙක් එක්තරා දුරකින් $\frac{1}{3}$ ක් නියත වේගයකින් ඇවිද ගොස්, එම දුරෙන් අනෙක් $\frac{2}{3}$ ඔහු ඇවිද ගිය වේගය මෙන් තුන්ගුණයක වේගයෙන් දුවයි. ඔහු එසේ මුළු දුර යාමට මිනිත්තු 30 ක් ගනියි නම්, ඇවිදීමෙන් පමණක් මුළු දුරම යාමට ඔහු කොපමණ වේලාවක් ගනියි ද?
(1) මිනිත්තු 40 (2) මිනිත්තු 45 (3) මිනිත්තු 50 (4) මිනිත්තු 54 (5) මිනිත්තු 60

- අංක **22, 23** හා **24** ප්‍රශ්න, පහත දක්වෙන තොරතුරු මත පදනම් වේ.

වී මෝල් හිමියෙක් ඊළඟ වී අස්වැන්න නෙළන කන්නයේදී ඔහු මිලට ගැනීමට බලාපොරොත්තුවන වීවලින් සහල් මෙට්‍රික් ටොන් 1235 ක් වෙළඳපළට නිකුත්කිරීමට සැලසුම් කරයි. මෙම ක්‍රියාවලියට අදාළව ඔහු විසින් පහත සඳහන් ද ඇස්තමේන්තු කර ඇත.

- වී ප්‍රවාහනය සහ ගබඩා කිරීම සඳහා පිරිවැය, මෙට්‍රික් ටොන් එකකට රු. 200 බැගින් වේ.
- ගබඩා කරනු ලබන වීවලින් අපතේ යන ප්‍රතිශතය 5% කි.
- වී මෙට්‍රික් ටොන් එකකින් නිපදවනු ලබන සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 0.65 කි.
- වී මෙට්‍රික් ටොන් එකක් ඇඹිරීම (සහල් බවට පත්කිරීම) සඳහා පිරිවැය රු. 1200 කි.
- අඹරන ලද වී මෙට්‍රික් ටොන් එකක අතුරු නිෂ්පාදන අලෙවියෙන් ලැබෙන ආදායම රු. 400 කි.
- සහල් මෙට්‍රික් ටොන් එකක් ඇසිරීමේ, ගබඩාකිරීමේ සහ ප්‍රවාහනය කිරීමේ පිරිවැය රු. 500 කි.

22. ඔහු විසින් වී මෙට්‍රික් ටොන් කීයක් මිලට ගත යුතු ද?
(1) 1500 (2) 1805 (3) 1900 (4) 2000 (5) 2020


23. අතුරු නිෂ්පාදනවලින් ඇස්තමේන්තු කරන ලද ආදායම කොපමණ ද?
(1) රු. 494 000 (2) රු. 760 000 (3) රු. 798 000 (4) රු. 800 000 (5) රු. 840 000

24. ඔහු සහල් මෙට්‍රික් ටොන් එකක් රු. 50 000 බැගින් අලෙවිකරයි නම් සහ වී මෙට්‍රික් ටොන් එකක් රු. 25 000 බැගින් මිලට ගනියි නම් මෙම ක්‍රියාවලියෙන් ඔහුගේ ඇස්තමේන්තු ගත ශුද්ධ ආදායම කොපමණ ද?
(1) රු. 9 212 500 (2) රු. 9 612 500 (3) රු. 11 750 000 (4) රු. 14 250 000 (5) රු. 15 100 000

25. සීනි මිල 20% කින් වැඩිවීමටත් පිටි මිල 5% කින් අඩුවීමටත් අනෙකුත් අඩංගු ද හා පිළිස්සීම (baking) සඳහා පිරිවැය 10% කින් වැඩිවීමටත් පෙර බටර් කේක් කිලෝග්‍රෑම් 1 ක් සෑදීමේ පිරිවැය රු. 180 ක් විය. බටර් කේක් කිලෝග්‍රෑම් එකක් සෑදීම සඳහා සීනි ග්‍රෑම් 200 ක් ද පිටි ග්‍රෑම් 500 ක් ද යොදා ගැනේ. මිල වෙනස්වීමට පෙර සීනිවල සහ පිටිවල මිල පිළිවෙළින් කිලෝග්‍රෑමයට රු. 100 හා රු. 80 බැගින් වූයේ නම්, බටර් කේක් කිලෝග්‍රෑමයක් සෑදීමේ නව පිරිවැය කොපමණ ද?
(1) රු. 183 (2) රු. 187 (3) රු. 194 (4) රු. 197 (5) රු. 209

26. අනුයාත නිඛිල (පූර්ණ සංඛ්‍යා) තුනක ගුණිතය පිළිබඳව පහත සඳහන් නිගමන සලකා බලන්න.
A - එම ගුණිතය 3 න් බෙදිය හැකි ය.
B - ප්‍රථම නිඛිලය ඔත්තේ නම් එම ගුණිතය 6 න් බෙදිය හැකි ය.
C - එය 13 න් බෙදිය නොහැකි ය.
සැමවිට ම සත්‍ය වන්නේ ඉහත කවර නිගමනය / නිගමන ද?
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) A හා C පමණි.

- අංක **27, 28** හා **29** ප්‍රශ්න, එක් නගරයක සිට තවත් නගරයකට ගමන් කරන *A* හා *B* රථ දෙකක පහත දක්වෙන වේග - කාල ප්‍රස්තාරය මත පදනම් වේ.




27. *B* රථයේ උපරිම වේගය කොපමණ ද?
(1) 90 km h$^{-1}$ (2) 96 km h$^{-1}$ (3) 108 km h$^{-1}$ (4) 112 km h$^{-1}$ (5) 120 km h$^{-1}$

28. *A* රථය පළමුවන නගරයෙන් පිටත් වී කොපමණ කාලයකට පසුව *B* රථය, *A* රථය පසු කළේ ද?
(1) මිනිත්තු 8.5 (2) මිනිත්තු 10 (3) මිනිත්තු 12 (4) මිනිත්තු 14 (5) මිනිත්තු 16

29. රථ දෙකෙහි මධ්‍යක (සාමාන්‍ය) වේග අතර වෙනස කොපමණ ද?
(1) 30 km h$^{-1}$ (2) 32 km h$^{-1}$ (3) 36 km h$^{-1}$ (4) 38 km h$^{-1}$ (5) 40 km h$^{-1}$

[ හතරවෙනි පිටුව බලන්න.

30. $A$ හා $B$ නම් පන්ති දෙකක පිරිමි ළමයින් සංඛ්‍යාව හා ගැහැනු ළමයින් සංඛ්‍යාව අතර අනුපාත පිළිවෙළින් 3 : 4 සහ 13 : 19 වේ. පන්ති දෙක එකතු කළ විට පිරිමි ළමයින් සංඛ්‍යාව හා ගැහැනු ළමයින් සංඛ්‍යාව අතර අනුපාතය 5 : 7 වේ. පන්ති දෙකෙහි ම මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 120 නම්, $A$ පන්තියෙහි ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද?
(1) 56 (2) 60 (3) 62 (4) 64 (5) 72

31. වැඩබිමක නිලධාරීන් දෙදෙනෙක්, පුහුණු කම්කරුවන් පස්දෙනෙක් සහ නුපුහුණු කම්කරුවන් අට දෙනෙක් සිටිති. නිලධාරියකුගේ, පුහුණු කම්කරුවකුගේ හා නුපුහුණු කම්කරුවකුගේ දෛනික වැටුප 3: 2: 1 අනුපාතයට වේ. මෙම සියලු දෙනාගේ ම දෛනික වැටුප රු. 12 000 නම්, පුහුණු කම්කරුවකුගේ දෛනික වැටුප කොපමණ ද?
(1) රු. 2 000 (2) රු. 1 500 (3) රු. 1 000 (4) රු. 800 (5) රු. 750

32. මනා සෞඛ්‍යය පවත්වා ගැනීම සඳහා සාම්ප්‍රදායික ආහාරවලට වඩා ශාකමය ආහාර යෝග්‍ය වනු ඇත. ශාකමය ආහාර පමණක් ගන්නා අය හෘද රෝගවලින් හා ස්ථූලතාවෙන් පීඩා විඳීම, මාංශමය ආහාර අනුභව කරන්නන්ට වඩා අඩු බව පර්යේෂණ පෙන්වා දී ඇත. ශාකමය ආහාර පමණක් අනුභව කරන අයට ඔවුන්ගේ නිර්දේශිත ප්‍රෝටීන අවශ්‍යතාව තම ආහාරවේලෙන් නොලැබෙන්නේදැයි සැකයක් පවතී.
ඉහත තර්කයෙහි ප්‍රධාන නිගමනය වඩාත් හොඳින් ප්‍රකාශ වන්නේ පහත දක්වෙන කවර ප්‍රකාශය මගින් ද?
(1) ශාකමය ආහාරවේලක් සාම්ප්‍රදායික ආහාරවේලකට වඩා සෞඛ්‍යයට හිතකර විය හැකි ය.
(2) ශාකමය ආහාරවේලක ප්‍රමාණවත් තරම් ප්‍රෝටීන අඩංගු වේ.
(3) සාම්ප්‍රදායික ආහාරවේලක් ප්‍රෝටීනවලින් ඉතා පොහොසත් ය.
(4) සමතුලිත ආහාරවේලක්, අනෙකුත් ඕනෑම සුවිශේෂ වර්ගයක ආහාරයකට වඩා හිතකර වේ.
(5) ශාකමය ආහාර පමණක් අනුභව කරන්නන් හෘද රෝගවලින් සහ ස්ථූලතාවෙන් පීඩා නොවිඳින තරම් ය.

33. කූඩු කරනු ලැබූ හිම වලස්සු, එකම ස්ථානයේ ඉදිරියටත් පසුපසටත් පියවර තබමින්, ඔවුන්ගේ හිස් පැත්තෙන් පැත්තට දෝලනය කරමින් ආතතිය පිළිබිඹු වන චර්යා රටා නිරතුරුව ප්‍රදර්ශනය කරති. මෙයින් සනාථ වන්නේ කූඩු කරනු ලැබීම, හිම වලසුන්ගේ ස්වාභාවික පරිසරය සඳහා සතුටුදායක ආදේශකයක් නොවන බවයි.
පහත දක්වෙන ප්‍රකාශ **සත්‍ය වේ නම්**, ඉන් කුමන ප්‍රකාශය, ඉහත තර්කය වඩාත්ම දුර්වල කරයි ද?
(1) හිම වලසුන් කූඩු කරනු ලැබූ ජීවිතයකට කැපී පෙනෙන ලෙස නොගැළපෙයි.
(2) වනයේ සිටින බොහෝ හිම වලස්සු, යළි යළිත් සිදුකරන චර්යා රටාවල නියැලෙති.
(3) කූඩු කරනු ලැබූ හිම වලසුන්ට වනයේ ජීවත්වන වලසුන්ට වඩා හොඳින් ආහාර සැපයේ.
(4) වනයේ සිටින හිම වලස්සු ඔවුන්ගේ ගොදුරු දඩයම් කරගැනීම සඳහා දිනකට බොහෝ දුරක් ගමන් කරති.
(5) කූඩු කරනු ලැබ සිටි හිම වලසුන්ට වනයේ ජීවත්වීමේ හැකියාව ක්ෂය වේ.

34. රට තුළට ජලභීතිකා රෝගය ඇතුළුවීම වැළැක්වීම ඉලක්ක කොට ඇති, රෝග වැළැක්වීම සඳහා වන නිරෝධායන නීතිරීති නිසා සමහර මිනිස්සු එක්තරා දූපත් රටකට එහි රේගුවට නොදන්වා සුරතල් සතුන් හොර රහසේ ගෙනඒමට උත්සාහ දරති. එහි එවැනි නීති නොතිබිණි නම්, සුරතල් සතුන් රේගුවට නොදන්වා රැගෙන ඒමට හේතුවක් නොමැති විය යුතුය. සුරතල් සතුන් රේගුවට නොදන්වා රැගෙන ඒම, දිවයින තුළ ජලභීතිකා ව්‍යසනයෙහි වඩාත්ම විය හැකි ප්‍රභවය බැවින්, නිරෝධායන නීති ඉවත්කළහොත් ජලභීතිකාව දිවයිනට ඇතුළුවීමේ අනතුර අඩුවනු ඇත.
ඉහත තර්කය වඩාත් ම දුර්වල කරන ප්‍රකාශය, පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් තෝරන්න.
(1) වන සතුන් මගින් ජලභීතිකා රෝගය දූපතට ඇතුළුවීමට ඉඩක් නොමැත.
(2) රේගුවට නොදන්වා සුරතල් සතුන් රැගෙන ඒම වැළැක්වීමට නිරෝධායන නීතිවලට නොහැකිය.
(3) නිරෝධායන නීති නොතිබිණි නම්, ජලභීතිකා රෝගයෙන් පෙළෙන සතුනට පහසුවෙන් රට තුළට ඇතුළුවිය හැකි වේ.
(4) මිනිසුන් ඔවුන්ගේ සුරතල් සතුන් සමඟ සංචාරයෙහි නොයෙදෙත් නම්, නිරෝධායන නීති අනවශ්‍ය වනු ඇත.
(5) සුරතල් සතුන් ජලභීතිකාවට එරෙහිව එන්නත් කර තිබිණි නම්, නිරෝධායන නීති අනවශ්‍ය වනු ඇත.

- අංක 35, 36 සහ 37 ප්‍රශ්න, පහත දක්වෙන තොරතුරු මත පදනම් වේ.

විශ්ව විද්‍යාලයක J, K, L, M, N, O සහ P නමැති රැස්වීම් හතක්, ඉරිදා දිනෙන් ආරම්භ කර සතියේ එක් එක් දිනයෙහි එක් රැස්වීම බැගින් පැවැත්විය යුතුව ඇත.
- J රැස්වීම ඉරිදා දින විය යුතු ය.
- K රැස්වීම, L සහ M රැස්වීම් දෙකටම පසුව විය යුතු ය.
- N, O සහ P රැස්වීම් අනුයාත දින තුනකදී විය යුතු අතර, එම දින තුන N, O, P **අනුපිළිවෙළින්ම වීම අනිවාර්ය නොවේ.**

35. L රැස්වීම පැවැත්විය හැකි සතියේ අවසාන දවස (latest day) කුමක් ද?
(1) අඟහරුවාදා (2) බදාදා (3) බ්‍රහස්පතින්දා (4) සිකුරාදා (5) සෙනසුරාදා

36. රැස්වීම් පැවැත්වීමේ අනුපිළිවෙළ සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත දක්වෙන කවරක් ද?
(1) J ට පසුව L පැවැත්වේ.
(2) O ට පසුව L පැවැත්වේ.
(3) O ට පසුව N පැවැත්වේ.
(4) P ට පසුව N පැවැත්වේ.
(5) P ට පසුව O පැවැත්වේ.

37. පහත සඳහන් කුමක් මගින්, අනුයාත දින තුනකදී රැස්වීම් පැවැත්විය හැකි පටිපාටිය නිරූපණය කෙරේ ද?
(1) J M K (2) K L O (3) M N J (4) O J N (5) P O M


38. මීටර 125 ක් දිග දුම්රියක් එකි දිශාවටම 2 km h$^{-1}$ වේගයෙන් දිවයන මිනිසකු තත්පර 10 ක් තුළදී පසුකරයි. දුම්රියේ වේගය

(1) 47 km h$^{-1}$ වේ  (2) 50 km h$^{-1}$ වේ.  (3) 54 km h$^{-1}$ වේ.  (4) 55 km h$^{-1}$ වේ.  (5) 60 km h$^{-1}$ වේ.


39. මිනිසුන් දසදෙනකුට දිනකට පැය 2 බැගින් වැඩකර එක්තරා වැඩක් දින පහකදී නිමකළ හැකි නම්, දිනකට පැය 5 බැගින් වැඩ කරන මිනිසුන් දෙදෙනකුට එම වැඩය නිමකිරීමට දින කීයක් අවශ්‍ය ද?

(1) 5  (2) 8  (3) 10  (4) 12  (5) 20

- අංක 40, 41 හා 42 ප්‍රශ්න, පහත දක්වෙන තොරතුරු මත පදනම් වේ.



එක් එක් පීඨයෙහි ශිෂ්‍ය ප්‍රතිශතය



කලා පීඨයෙහි විදේශීය ශිෂ්‍ය ප්‍රතිශතය

ඉහත දී ඇති වට සටහන් (pie charts) මගින් අන්තර්ජාතික විශ්වවිද්‍යාලයක එක් එක් පීඨයෙහි සිටින ශිෂ්‍ය ප්‍රතිශතයත්, කලා පීඨයෙහි සිටින විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවත් දක්වෙයි. කලා පීඨයෙහි සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1120 කි.

40. කලා පීඨයෙහි ශිෂ්‍යයන්ගෙන් කවර ප්‍රතිශතයක් විදේශීය ශිෂ්‍යයන් ද?

(1) 9%  (2) 10%  (3) 11%  (4) 14%  (5) 15%


41. විශ්වවිද්‍යාලයෙහි සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද?

(1) 4450  (2) 4460  (3) 4480  (4) 4560  (5) 4640

42. යුරෝපීය වෛද්‍ය ශිෂ්‍යයෝ 28 දෙනෙක් සිටිති. මුළු වෛද්‍ය ශිෂ්‍යයන්ගෙන් කවර ප්‍රතිශතයක් ඔවුන්ගෙන් නිරූපණය කෙරේ ද?

(1) 2.8%  (2) 7.5%  (3) 12.5%  (4) 15%  (5) 20%


43. එකම ඝනකයක පැති පෙනුම් තුනක් පහත දක්වේ.




 ට ප්‍රතිවිරුද්ධ පැත්තේ පිහිටන රූපය කුමක් ද?

(1)   (2)   (3)   (4)   (5) 


44. දී ඇති පතරම (net) ඇසුරෙන් සකස් කළ හැක්කේ පහත දක්වෙන කවර ඝනකය ද?






(1)  (2)  (3)  (4)  (5)

45. දී ඇති පතරම (net) ඇසුරෙන් සකස් කළ හැක්කේ පහත දක්වෙන කවර ඝන හැඩය ද?





(1)  (2)  (3)  (4)  (5)

- අංක **46** හා **47** ප්‍රශ්න පහත දක්වෙන තොරතුරු මත පදනම් වේ.


ප්‍රීතිමත් බව පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව, "වත්මන් ලෝකයේ ප්‍රීතිමත් බවෙහි මට්ටමත් පෞද්ගලික හා ජාතික වශයෙන් එය වෙනස්වන්නේ කෙසේද යන්නත් විමසීමේ" අධ්‍යයනයක් කොලොම්බියා විශ්වවිද්‍යාලයට පැවරිය. "ලෝකයේ ප්‍රීතිමත් බව පිළිබඳ වාර්තාව - 2012" නමින් කොලොම්බියා විශ්වවිද්‍යාලයේ පෘථිවි ආයතනය විසින් පළකරන ලද එම අධ්‍යයනයේ නිගමනය වූයේ, ප්‍රීතිමත් බව සපුරාගැනීම සඳහා යම් මූලික ජීවන තත්ත්වයක් අත්‍යවශ්‍ය වුවත් ඒ අවම තත්ත්වය සපුරනු ලැබීමෙන් අනතුරුව, යමකුගේ ආදායමට වඩා තම මානව සම්බන්ධතාවල ගුණාත්මක බව අනුව ප්‍රීතිමත් බව විචලනය වන බවයි. පෘථිවිය මත ජීවත්වන වඩාත්ම ප්‍රීතිමත් ජනයා ස්කැන්ඩිනේවියානුවෝ වෙති. ඩෙන්මාර්කය, ප්‍රීතිමත් බව පිළිබඳ වේදිකාවේ ෆින්ලන්තය හා නෝර්වේ සමඟ ප්‍රමුඛ ස්ථාන ගනී. ආසියාවේ ප්‍රීතිමත්ම ජාතිය සිංගප්පූරු වැසියන් වුවත්, ඔවුනට ලෝකයේ හිමිවන්නේ තරමක් පහළ 33 වන ස්ථානයයි. ජාතීන් 166 අතුරෙන් ශ්‍රී ලංකාවට හිමිවී ඇත්තේ 130 වන ස්ථානයයි. 166 වන ස්ථානය හිමිවන්නේ ටෝගෝ රටටයි.

46. ඉහත ඡේදයෙහි සඳහන් ප්‍රකාශ **නොවන** අදහස කුමක් ද?
    (1) ප්‍රීතිමත් බව පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව, අද ලෝකයේ ප්‍රීතිමත් බවෙහි මට්ටම විමර්ශනය කිරීම සඳහා අධ්‍යයනයක් ක්‍රියාත්මක කළේය.
    (2) කොලොම්බියා විශ්වවිද්‍යාලයේ පෘථිවි ආයතනය, "ලෝකයේ ප්‍රීතිමත් බව පිළිබඳ වාර්තාව - 2012" ප්‍රකාශයට පත් කළේය.
    (3) ප්‍රීතිමත් බව සඳහා මූලික ජීවන ප්‍රමිති අත්‍යවශ්‍ය වේ.
    (4) රටක යහපාලනය සහ ප්‍රීතිමත් බවේ දර්ශකය අතර සහසම්බන්ධතාවක් තිබේ.
    (5) මූලික මට්ටම සපුරාලනු ලැබූ විට, ප්‍රීතිමත් බව ආදායමට වඩා මානව සම්බන්ධතාවල ගුණාත්මක බව සමඟ විචලනය වෙයි.

47. ඉහත ඡේදයෙහි සඳහන් ප්‍රකාශ වන අදහස කුමක් ද?
    (1) යමකුගේ ඇතුළාන්තය සැමවිටම ආදරයෙන්, සාමයෙන් හා ප්‍රීතිමත් බවින් පිරී තිබේ.
    (2) ප්‍රීතිමත් බව හුදෙක් ආදායම සමඟ පමණක් විචලනය වෙයි.
    (3) ලෝකයේ වඩාත්ම ප්‍රීතිමත්ව සිටින්නෝ ඩෙන්මාර්කයේ මිනිස්සු වෙති.
    (4) වාර්තා වී ඇති රටවල් 166 අතුරෙන්, ප්‍රීතිමත් බව අඩුම රට උගන්ඩාවයි.
    (5) සිංගප්පූරු වැසියෝ ආසියානුවන් අතර ප්‍රීතිමත්ම අය වුවත් සාපේක්ෂව පහළ තරාවක් වන 33 වන ස්ථානය ගනිති.

- අංක **48** සහ **49** ප්‍රශ්න, පහත දක්වෙන තොරතුරු මත පදනම් වේ.

පසුගිය වර්ෂ හතර තුළ අ.පො.ස. උසස් පෙළ විභාගය පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල 15 හි විවිධ විෂය ධාරා සඳහා වාර්ෂිකව ඇතුළු කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව පහත ප්‍රස්තාරවල නිරූපණය වේ.




48. 2006/07 සිට 2009/10 තෙක් ඇතුළු කරගන්නා ලද ශිෂ්‍යයන් සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය නිවැරදි ද?
    (1) වාණිජ විෂය ධාරාවට ඇතුළු කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාවෙහි සතත (පියවරෙන් පියවර) වැඩිවීමක් ඇත.
    (2) කලා විෂය ධාරාවට ඇතුළු කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාවෙහි සතත වැඩිවීමක් ඇත.
    (3) භෞතික විද්‍යා විෂය ධාරාවට ඇතුළු කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාවෙහි සතත වැඩිවීමක් ඇත.
    (4) විද්‍යා විෂය ධාරාවට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් කලා විෂය ධාරාවට ඇතුළු කරගනු ලැබේ.
    (5) වාණිජ විෂය ධාරාවට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් භෞතික විද්‍යා විෂය ධාරාවට ඇතුළු කරගනු ලැබේ.

49. පහත දක්වෙන කවර ප්‍රකාශය **සාවද්‍ය** වේ ද?
    (1) කලා හා ජෛව විද්‍යා විෂය ධාරා දෙකෙහිම වාර්ෂිකව ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවී ඇත.
    (2) වාණිජ සහ භෞතික විද්‍යා විෂය ධාරා දෙකෙහිම වාර්ෂිකව ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යාවේ අඩුවැඩිවීමක් දක්වයි.
    (3) සමහර විෂය ධාරාවලට වාර්ෂිකව ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යා අඩුවැඩිවීම හේතුවෙන් ඇතුළත් වන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙහි වාර්ෂික වැඩිවීමක් පෙන්නුම් නොකෙරේ.
    (4) 2009/10 වර්ෂයේදී ඇතුළත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව, ඊට පෙර වර්ෂයේ ඇතුළත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි ය.
    (5) වාණිජ සහ භෞතික විද්‍යාව යන එක් එක් විෂය ධාරාවට එක් එක් වර්ෂයේදී ඇතුළත් වූයේ 5000 ට අඩු ශිෂ්‍ය සංඛ්‍යාවකි.

● අංක 50 සහ 51 ප්‍රශ්න, පහත දක්වෙන තොරතුරු මත පදනම් වේ.

ශ්‍රී ලංකාවේ මෑත වර්ෂවලදී අ.පො.ස. උසස් පෙළ විභාගයට අපේක්ෂකයන් 200 000 ක් පමණ ප්‍රථමවරට ද තවත් සිසුන් 75 000 ක් පමණ දෙවනවරට හෝ තෙවනවරට ද විභාගයට පෙනී සිට ඇත. සිසුහු 20 000 ක් පමණ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනෙති. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළුවීමට සුදුසුකම් නොලබන සිසුන්ට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි පදනම් පාඨමාලා හදාරා එහිම උපාධි පාඨමාලා හැදෑරීමට සුදුසුකම් ලැබිය හැකිය. සහතික පත්‍ර, ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා පවත්වනු ලබන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන කිහිපයක් ද ශ්‍රී ලංකාවෙහි ඇත. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට තෝරාගනු ලැබූ හා නොලැබූ දෙවර්ගයේම සිසුහු තමා වඩාත් කැමති පාඨමාලා හැදෑරීම සඳහා මෙම ආයතනවලට ඇතුළු වෙති. 2007/08, 2008/09 හා 2009/10 වර්ෂවලදී විශ්වවිද්‍යාලවලට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළු වූ ශිෂ්‍ය සංඛ්‍යාවල ප්‍රතිශත පිළිවෙළින් 16.53%, 16.01% හා 17.00% විය.

50. පහත දක්වෙන කවර ප්‍රකාශය **සාවද්‍ය** වේ ද?
   (1) පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ශ්‍රී ලංකාවේ උපාධි පාඨමාලා ප්‍රදානය කිරීමෙහි නිරත වේ.
   (2) සිසුහු රාජ්‍ය විශ්වවිද්‍යාලවල තමා වඩාත් කැමති පාඨමාලා නොලබන විට, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළුවීමට අපේක්ෂා කරති.
   (3) දී ඇති සංඛ්‍යාමය තොරතුරු පදනම් කරගෙන, 2010/11 අධ්‍යයන වර්ෂයෙහි විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට සුදුසුකම් ලබන ශිෂ්‍ය ප්‍රතිශතය නිවැරදිව පුරෝකථනය කළ නොහැකි ය.
   (4) දී ඇති අධ්‍යයන වර්ෂවලදී උසස් පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍යයන්ගෙන් 16.5 ± 1.0% ක් විශ්වවිද්‍යාලවලට ඇතුළු කරගනු ලැබූහ.
   (5) 2009/10 අධ්‍යයන වර්ෂයේදී, සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන්ගෙන් අනෙක් වර්ෂ දෙකටම වඩා වැඩි ප්‍රතිශතයක් රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළුකරගනු ලැබිණි.

51. පහත දක්වෙන කවර ප්‍රකාශය සත්‍ය වේ ද?
   (1) අනෙකුත් අවුරුදු දෙක හා සැසඳූ විට, 2008/09 අධ්‍යයන වර්ෂයේදී සිසුන් වැඩි සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලයට ඇතුළුවීමට නොහැකි විය.
   (2) රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළුවීමට සුදුසුකම් නොලබන සිසුහු විවෘත විශ්වවිද්‍යාලයට ඇතුළුවීමට ද සුදුසුකම් නොලබති.
   (3) රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළුකර ගැනෙන සිසුහු පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළුවීමට අපේක්ෂා නොකරති.
   (4) රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළුවීමට සුදුසුකම් ලබන සිසුහු පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළුවීමට ද සුදුසුකම් ලබති.
   (5) ප්‍රවේශ සුදුසුකම් ලබා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළුකර නොගැනෙන සිසුනට විවෘත විශ්වවිද්‍යාලයට ඇතුළුවීමට අවස්ථා ඇත.

52. ශ්‍රී ලාංකික රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළුවීම පිළිබඳව පහත දක්වෙන කවර ප්‍රකාශය **අසත්‍ය** වේ ද?
   (1) අවශ්‍යතාව වනුයේ උසස් පෙළ අදාළ විෂය තුන සමත් වීම, අධ්‍යාපන පාඨමාලාව සඳහා දිස්ත්‍රික්කයේ සීමාසන්න ලකුණට සමාන හෝ ඉහළ Z ලකුණක් ලැබීම සහ සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් සමත් ලකුණු ලැබීමයි.
   (2) කලා විෂය ධාරාවෙහි ශිෂ්‍යයෝ ඉංජිනේරු උපාධි පාඨමාලාවලට ඇතුළුවීම අපේක්ෂා නොකරති.
   (3) විද්‍යා විෂය ධාරාවෙහි ශිෂ්‍යයන්ට කවර හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල මණ්ඩපයක හෝ කළමනාකරණ අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමේ අවස්ථාව නොමැත.
   (4) ශිෂ්‍යයන්ට සියලුම විෂය ධාරා හරහා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළු වී තොරතුරු තාක්ෂණ (IT) උපාධි පාඨමාලා හැදෑරිය හැකිය.
   (5) දන්ත හා පශු වෛද්‍ය පාඨමාලා ඇත්තේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි පමණි.

● අංක 53 සහ 54 යන එක් එක් ප්‍රශ්නයෙහි A සිට F තෙක් නම් කරන ලද ප්‍රකාශ හය බැගින් දී ඇත. ඒවායින් **තුනක්** කාලානුරූප අනුපිළිවෙළකට පිළියෙල කළ හැකිය. එම ප්‍රකාශ තුන කාලානුරූප අනුපිළිවෙළින් දක්වෙන අක්ෂර අඩංගු වරණය තෝරන්න.

53. A - ඇන්ඩෘගේ පියා වන ඩේවිඩ් ගුරුවරයෙකි.
   B - ඇන්ඩෘ පොල් කඩන්නකු සොයා ගියේ ය.
   C - ඩේවිඩ් වැව ඇරි මනුගේ මෝටර් සයිකලයෙන් ආපසු පැමිණියේ ය.
   D - ඩේවිඩ් පොල් කඩන්නාට මුදල් වෙනුවට එක් ගසකට ගෙඩි දෙක බැගින් පොල් දුන්නේ ය.
   E - ඩේවිඩ් 5 වන ශ්‍රේණියේ සිසුනට පන්තියක් පවත්වනු දක්නට ලැබිණි.
   F - පොල් කඩන්නා පොල් ගසකට නගිනු දක්නට ලැබිණි.
   (1) ACE   (2) ADB   (3) BAE   (4) BFD   (5) CAE

54. A - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කැලණි ගඟෙහි සමහර තොටුපළවල වැලි ගොඩ දැමීම සඳහා බලපත්‍ර නිකුත් කරයි.
   B - වැලි ගොඩ දමන මිනිසෙක් පුගොඩ කැලණි ගං පතුලෙහි රන්පත් සොයා ගත්තේ ය.
   C - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැලි ගොඩ දැමීමේ ව්‍යාපාරය නවත්වයි.
   D - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රත්රන් ගැරීමේ බලපත්‍ර නිකුත් කිරීමෙන් රත්රන් ගැරීම විධිමත් කළේ ය.
   E - වැලි ගොඩ දමන්නෝ දැන් රත්රන් ගැරීමේ නිරතව සිටිති.
   F - මිනිස්සු, ගැහැනු හා ළමයි නීති විරෝධීව රත්රන් ගැරීම සඳහා කැලණි ගඟෙහි පුගොඩ තොටුපළට යති.
   (1) ABE   (2) AEC   (3) BFD   (4) BFE   (5) FDE

[ අනෙක් පිටුව බලන්න.


- අංක 55 සහ 56 ප්‍රශ්නවල I, II, III යනුවෙන් අංකිත කරුණු තුනක් හා එක් නිගමනයක් බැගින් අඩංගු වේ.

ඕනෑම එක් කරුණක් භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් A තෝරන්න.
I සහ II කරුණු භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් B තෝරන්න.
I සහ III කරුණු භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් C තෝරන්න.
II සහ III කරුණු භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් D තෝරන්න.
නිගමනයට එළඹීම සඳහා කරුණු තුනම අවශ්‍ය නම් E තෝරන්න.

55. **නිගමනය** : ප්‍රේමා, පද්මා සහ අරුනි යන තිදෙනාටම වඩා ප්‍රියා ඉහළ ලකුණු ලබා ගත්තාය.
(I) ප්‍රියා, ප්‍රේමාට වඩා වැඩියෙන් ලකුණු ලබා ගත්තාය.
(II) පද්මා සහ ප්‍රේමා සමානව ලකුණු ලැබූහ.
(III) අරුනි, ප්‍රේමාට වඩා අඩුවෙන් ලකුණු ලැබුවාය.
(1) A (2) B (3) C (4) D (5) E

56. **නිගමනය** : 2012 වර්ෂයේ මුල් හය මාසය තුළදී උතුරු පළාතේ කුටුම්භවලින් 50% කට සති අන්තවල දහවලෙහි විදුලිය නොලැබිණි.
(I) ඉන්ධන පිරිමසා ගැනීම සඳහා සති අන්තවල දහවලෙහි, ප්‍රධාන විදුලි උපපොළෙහි ස්විච් (switch) නිවා දැමුණු බැවින් උතුරු පළාතේ 15% ක් කුටුම්භවලට විදුලිය නොලැබිණි.
(II) සති අන්තවල දහවලෙහි, විවිධ ප්‍රදේශවල මාර්ග පුළුල් කිරීම සහ විදුලි කණු ස්ථානගත කිරීම නිසා උතුරු පළාතේ 35% ක් කුටුම්භවලට විදුලිය නොලැබිණි.
(III) දෝෂ සහිත සැපයුම් මාර්ග අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රධාන විදුලි උපපොළෙහි ස්විච් (switch) සති අන්තවල දහවලෙහි නිවාදැමුණු බැවින් උතුරු පළාතේ 15% ක් කුටුම්භවලට අඛණ්ඩ විදුලි සැපයුමක් නොලැබිණි.
(1) A (2) B (3) C (4) D (5) E

57. තිත් ඉරි දිගේ කැපූ විට සර්වසම කොටස් දෙනු ලබන්නේ පහත දක්වෙන කවර රූප මගින් ද?
(1) A සහ B
(2) A සහ C
(3) A සහ D
(4) A සහ E
(5) B සහ E


A B C D E


- අංක 58 සහ 59 යන එක් එක් ප්‍රශ්නයේ, එක්තරා ක්‍රියාවලියක සමහර ක්‍රියාකාරකම් දක්වීම සඳහා පින්තූර කට්ටලය බැගින් දී ඇත. එම ක්‍රියාකාරකම්වල නිවැරදි අනුපිළිවෙළ දක්වෙන පිළිතුර තෝරන්න.

58.


A B C D E F

(1) ABCFDE (2) ABFCDE (3) AFCDBE (4) BCFDEA (5) BFCDEA

59.


A B C D E F

(1) ACBFED (2) ADECBF (3) BECAFD (4) AEDCBF (5) AEDCFB

60. මෙම ප්‍රශ්නයෙහි, එක එකක් ප්‍රකාශ තුනකින් සමන්විත කෙටි ඡේද පහක් දී ඇත. ඒවා අතුරෙන්, **සිදුවීම්වල වඩාත් පිළිගත හැකි අනුක්‍රමය** සහිත ඡේදය තෝරන්න.
(1) ගිහාන්, රොහාන්ගේ හොඳ මිතුරෙකි. රොහාන් ක්‍රිකට් ක්‍රීඩා කරයි. ගිහාන් ගිටාරය වයයි.
(2) මෙවන් අසනීප විය. වෛද්‍යවරයා මෙවන්ට බෙහෙත් දී ව්‍යායාම කිරීමට ද උපදෙස් දුන්නේ ය. මෙවන් ශාරීරික අභ්‍යාස පුහුණු පන්තියකට සහභාගි විය.
(3) සමහර පාසල් බස්රථ සාමාන්‍යයෙන් ප්‍රමාද වී පාසලට යයි. මෝටර් සයිකලය, පාසල් බස්රථයට වඩා වේගවත් ය. ඇන්ඩෲ පාසල් යාම සඳහා මෝටර් සයිකලයක් මිලට ගත්තේ ය.
(4) කමලා තද වර්ණවලට කැමති ය. කමලාගේ හොඳම මිතුරා වන විල්රෝෂන් තරුපැහැ පෙනුමෙන් යුක්ත ය. විල්රෝෂන්ගේ පියා ද තරුපැහැ පෙනුමෙන් යුක්ත ය.
(5) [illegible] ගුරුත්වජ බලය හේතුවෙන් ජලය පහළට ගලයි. ගුරුත්වජ බලය ජල (විදුලි) බලය නිපදවයි.